කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

**ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය - 2018/2019**

**SOC 2121 - සමාජ සංස්ථා**

පැ දෙකයි (02)

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න**

---

1. 'සමාජ සංස්ථා ගොඩනැගෙන්නේත් පවත්වා ගැනෙන්නේත් කිසියම් සමාජයක පිළිගත් අගයයන් සහ ධර්මතා ආරක්ෂා කර ගැනීමටයි.' මෙම ප්‍රකාශය උදාහරණ සහිතව විභාග කරන්න.

2. 18 වන සියවසේදී කාර්මීකරණය විසින් මිනිසුන්ගේ ජීවිත පරිවර්තනය කළේ කෙසේ ද? එය ස්ත්‍රීන්ගේ සහ පුරුෂයින්ගේ සමාජ භූමිකා පරිවර්තනය කිරීමට දායක වූ ආකාරය කෙරෙහි අවධානය යොමු කරමින් සාකච්ඡා කරන්න.

3. ලිංගිකත්වය පිළිබඳ තත්කාලීනව වෙනස් වන චර්යා සහ ආකල්ප හමුවේ පවුලේ සාම්ප්‍රදායික කාර්යභාරය වෙනස් වේ යැයි ඔබ සිතනවා ද? උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

4. ආගම සාමූහික හෘදය සාක්ෂිය ශක්තිමත් කරන බව කෘත්‍යවාදීහු ප්‍රකාශ කරති. මෙම ප්‍රකාශය ශ්‍රී ලංකාව වැනි බහු ආගමික සමාජවලට අදාලයැයි ඔබ සිතනවා ද? ශ්‍රී ලංකාවේ මෑත කාලීන සිදු වීම් කෙරෙහි අවධානය යොමු කරමින් විචාරශීලීව සාකච්ඡා කරන්න.

5. 'අධ්‍යාපනය කිසියම් සමාජයක කේන්ද්‍රීය අගයයන් ප්‍රවර්ධනය උදෙසා කැප වේ.' අධ්‍යාපනය පිළිබඳ කෘත්‍යවාදී සහ නව මාක්ස්වාදී අදහස් කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශය විචාරාත්මකව සාකච්ඡා කරන්න.

6. 'සමාජ සංවිධාන නොවන්නට සමාජ සංස්ථා පිළිබඳ සාකච්ඡාවක් නොමැති වනු ඇත.' මෙම ප්‍රකාශයේ සත්‍යාසත්‍යතාව විචාරාත්මකව සාකච්ඡා කරන්න.

******************************